ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
තෙල් පිරිපහදුව සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ .

ආපනශාලා පවත්වා ගෙනයාම සඳහා ලංසු පත්‍රිකාව
2026/2027
<u>ටෙන්ඩර් අංක **REF-PD/SER/10/2026**</u>

**කළමනාකාර (ව්‍යාපෘති),**
**ව්‍යපෘති අංශය,**
**තෙල් පිරිපහදුව,**
**සපුගස්කන්ද.**


| | | |
|---|---|---|
| දුරකථන අංකය | : | +94(0)117732977 |
| ෆැක්ස් | : | 0112400431 |
| ඊ-මේල් | : | drm.mp@ceypetco.gov.lk. |
| දිනය | : | 2026.05.09 |

ලංසු ආරාධනයයි.
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ
2026/2027 වර්ෂ සඳහා තෙල් පිරිපහදුවේ සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ
ආපනශාලා පවත්වා ගෙනයාම සඳහා
ලංසු කැඳවීමයි (<u>ටෙන්ඩර් අංක **REF-PD/SER/10/2026**</u>)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදු ප්‍රසම්පාදන කමිටුවේ (DPC- Minor) සභාපති විසින් 2026/2027 වර්ෂ සඳහා සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ප්‍රධාන ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා පිළිගත් ආපනශාලා සේවාවන් සපයන්නන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු මිල ගණන් කැඳවනු ලැබේ.

ලංසුකරණය පිළිබඳ විස්තර තොරතුරු අපගේ වෙබ් අඩවිය වන http://ceypetco.gov.lk/public-tenders/.වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපි ලේඛන ආපසු නොගෙවන රුපියල් දහසක (1000.00) ගාස්තුවක් ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාවට ගෙවීමෙන් හා කළමනාකාර (ව්‍යාපෘති), ව්‍යපෘති අංශය, තෙල් පිරිපහදුව, සපුගස්කන්ද වෙත ලිඛිත අයදුම්පතක් (ඉල්ලීමක්) ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2026.05.19 වන දින සිට 2026.06.18 වන දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනවලදී 09.00 පැයේ සිට 14.00 පැය දක්වා පමණක් කළමනාකාර (ව්‍යාපෘති), ව්‍යපෘති අංශය, තෙල් පිරිපහදුව, සපුගස්කන්ද.** වෙතින් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.

සියළුම අයදුම්කරුවන් වෙනුවෙන් ලංසු පිලිබඳ ගැටළු හෝ අපැහැදිලි තැන් සාකච්ඡා කිරීම සඳහා **පෙර දැනුවත් කිරීමේ සාකච්ඡාවක් (Pre-Bid Meeting) 2026.06.04 දින පෙ. ව. 10.00 ට පිරිපහදු පුහුණුකිරීම් අංශයේ රැස්වීම් ශාලාවේදී** පැවැත්වීමට කටයුතු කරන බවත්, ඊට සහභාගී වීම මෙදිනම ආපනශාලාව පරීක්ෂා කිරීමට හැකි බවත්, දන්වමි.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි ආරක්ෂිත ලංසු බැදුම්කරයක් (Tender Security) ලෙස ආපසු ගෙවන මුදලින් රුපියල් විසිපන් දහසක් (25,000.00) මුදලක් ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් බැංකු අණකරයක් හෝ අයදුම්පත සමඟ ඇමිණිය යුතුය. අයදුම්පත් සමඟ ඉදිරිපත් කෙරෙන **ආරක්ෂිත ලංසු බැදුම්කරය 2026.09.19** දින දක්වා වලංගු විය යුතුය.

නිසි අයුරින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද **ලංසු අයදුම්පත් ලංසු භාරගන්නා අවසාන දිනය වන 2026.06.19 වන දින 14.00 පැයට පෙර පිරිපහදු කළමණාකාර කාර්යාලය (සපුගස්කන්ද) අසල තබා ඇති ලංසු පෙට්ටියේ** තැන්පත් කිරීම මඟින් ලංසු ඉදිරිපත් කළ හැකිය. අදාල දිනයේ නියමිත වේලාවටම එම ලංසු විවෘත කරනු ලබන අතර, ඉහත වේලාව ඉක්මවා ගොස් ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද දන්වමි. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා අදාල ලංසුකරුට හෝ ඔහු විසින් ලිඛිතව නම් කරනු ලබන එක් අයෙකුට පමණක් සහභාගි විය හැකිය. වැඩි දුරටත් අවශ්‍ය විස්තර ලංසු පත්‍රිකාවේ සඳහන්ව ඇත.

<u>සියළුම පැහැදිලි කර ගැනීම් සඳහා</u> දුරකථන 011-7732977 මඟින් සපුගස්කන්ද පිරිපහදු ව්‍යාපෘති කාර්යාලයෙන් විමසිය හැකිය.

කළමනාකාර (ව්‍යාපෘති),
ව්‍යපෘති අංශය,
තෙල් පිරිපහදුව,
සපුගස්කන්ද.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ
තෙල් පිරිපහදුවේ සහ සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ
ආපනශාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඇති කොන්දේසි

## 01. ලංසු අයදුම්කරන කරන ආකාරය

1.1 ආපනශාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඉල්ලුම් කිරීමේ දී රුපියල් දහසක (රු.1,000.00 ආපසු නොගෙවන තැන්පතු මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවා ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ලංසු තොරතුරු ලේඛනය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කාර්යාංශයේ ව්‍යාපෘති කළමණාකාරගෙන් ලබාගත හැකිය. එම ලේඛනයන් **2026.05.19 වන දින සිට 2026.06.18 දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවලදි 09.00 පැයේ සිට 14.00 පැය දක්වා නිකුත් කෙරේ.**

1.2 ඉදිරිපත් කරන **ලංසුවල වලංගු කාලය 21.08.2026** දක්වා විය යුතුය.

1.3 අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි ආරක්ෂිත ලංසු බැදුම්කරයක් (Tender Security) ලෙස ආපසු ගෙවන මුදලින් රුපියල් විසිපන් දහසක (25,000.00) මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් මහ බැංකුව අනුමත කරන ලද බැංකුවකින් ලබගත් බැංකු අණකරයක් (**ඇමුණුම් අංක 04**) අයදුම්පත සමඟ ඇමිණිය යුතුය.

1.4 අයදුම්පත් සමඟ ඉදිරිපත් කෙරෙන ආරක්ෂිත ලංසු බැදුම්කරය (Tender Security) (**ඇමුණුම් අංක 04**) **2026.09.19** දින දක්වා වලංගු විය යුතුය.

1.5 ලංසු ලේඛන ලබාගත් සියළුම අයදුම්කරුවන් වෙනුවෙන් ලංසු පිලිබඳ ගැටළු හෝ අපැහැදිලි තැන් සාකච්ඡා කිරීම සඳහා පෙර දැනුවත් කිරීමේ සාකච්ඡාවක් **(Pre-Bid Meeting) 2026.06.04 දින පෙ. ව. 10.00ට** පිරිපහදු පුහුණුකිරීම් අංශයේ රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට කටයුතු කරන බවත්, ඊට සහභාගීවී මෙදිනම ආපනශාලාව පරික්ෂා කිරීමට හැකි බවත්, දන්වමි.

1.6 කළමනාකාර (ව්‍යාපෘති) තැනගේ නිර්දේශ මත ලංසු ඉල්ලුම්පත් නිකුත් කරන කාලය තුළ සියළුම ඉල්ලුම්කරුවන් සඳහා ආපනශාලාව පරීක්ෂා කිරීමට අවසරය ලබාදෙනු ඇත.

1.7 ආපනශාලා පවත්වා ගෙන යාම සඳහා තෝරාගනු ලබන ලංසුකරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආපනශාලා සඳහා ලබා දී ඇති දේපළ වෙනුවෙන් කාර්යසාධක බැඳුම්කරයක් (Performance Security bond) ලෙස ගිවිසුම් කාලය අවුරුද්දක් දක්වා වලංගු වන පරිදි රුපියල් ඒක්ලක්ෂ විසිපන්දහසක (රු.125,000.00 ක) ආපසු ගෙවන තැන්පතු මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නමින් මුදලින් තැන්පත් කිරීමෙන් හෝ එම වටිනාකමින් යුතු මහ බැංකුව අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබාගත් බැංකු අණකරයක් (ඇමුණුම් අංක 05) ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය. එකී ඇප තැන්පතුව වෙනුවෙන් කිසිදු පොළියක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවනු නොලැබේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඔබ ආයතනය විසින් සපයනු ලබන උපකරණ (ඇමුණුම් අංක 02)

සඳහා අලාභහානි සිදු වුව හොත් මෙම ගිවිසුම් කාලසීමාව අවසානයේදී ඒවා තැන්පත් මුදලින් ආවරණය කරගනු ලබන අතර, තැන්පත් මුදලින් ඉතිරි මුදලක් වේ නම් එම මුදල මෙම ගිවිසුම අවසානයේ දී ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය හා වට්ටෝරුගත බඩු භාණ්ඩවල නිවරද්‍යතාවය තහවුරු කිරීමෙන් පසු, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංසුකරු වෙත ආපසු ගෙවනු ලැබේ.

1.8 ලංසු බහාලන කවරයේ වම්පස "ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදු සහ සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්තයේ ආපනශාලා සඳහා ලංසු අයදුම්පත 2026/2027................................ " යනුවෙන් සඳහන් කොට **2026.06.19 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන ලෙස මෙහි සඳහන් පරිදි පිරිපහදු කළමණාකාර කාර්යාලය (සපුගස්කන්ද) අසල ඇති ලංසු පෙට්ටියේ බහාලිය යුතුය.**

1.9 ලංසුකරු ආපනශාලා භාරගත් දින සිට මාස 03 ක අධීක්ෂණ කාලයකට යටත්ව වසරක (01) කාලයක් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආපනශාලා සේවය සැපයීමට බැඳී සිටී. වසරක කාලයකට පසු ආපනශාලා කමිටුවේ නිර්දේශ හා දෙපාර්ශවයේ එකගතාවය මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂගේ හා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත තවත් වසරක් සඳහා මිල ගණන් සංශෝධනයන්ට යටත්ව එම සේවය සැපයීමට කටයුතු කල හැක.

1.10 ලංසුකරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ මාස 13ක කාලයක ගිවිසුමකට (ඇමුණුම් අංක 05) එළඹිය යුතුය. ගිවිසුම් කාල සීමාව අවසන් වූ දින ලංසුකරු විසින් ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ආපසු භාර දිය යුතුය.

1.11 නියමිත කාළසීමාව අවසන් වීමට පෙර ගිවිසුම අවසන් කිරීමට ලංසුකරු හෝ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව අදහස් කරන්නේ නම් එකී පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත ඒ පිළිබඳව මාසයකට පෙර දැනුම් දිය යුතුය.

1.12 මෙම ගිවිසුම සම්බන්ධයෙන් ඇති වන සියළුම ප්‍රශ්න හා ගැටළු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආපනශාලා කමිටුව වෙත ඉදිරිපත් කළයුතු අතර, එකී ප්‍රශ්න හෝ ගැටළු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ගනුලබන තීරණය අවසාන තීරණය වේ.

## 02 ඇගයීම් නිර්ණායක

2.1 අයදුම්පත සමඟ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කල යුතුය.

1. මූලික තොරතුරු

   i. මිළ ගණන් පත්‍රිකාව (ඇමුණුම් අංක 01)
   ii. දිවුරුම් ප්‍රකාශය (ඇමුණුම් අංක 06)
   iii. රුපියල් 25,000 ක ආරක්ෂිත බැඳුම්කරයට අදාල රිසිට්පත
   iv. ලංසු නිශ්චිත වලංගු කාලය තහවුරු කර ඇද්ද යනවග
   v. පසුගිය වසර තුනක (03) (2023-2025) කලයක් තුළ ලංසුකරු විසින් සපයන ලද සේවාවන් සහ අවම වශයෙන් ආයතන දෙකක් (02) පිළිබඳව අඛණ්ඩව වර්ෂයක කාලයක්වත් පවත්වා ගෙන යන ලද විස්තරයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. (සේවක විස්තර, සේවක අර්ථසාධක ගෙවීම් විස්තර, දැනට නිශ්චිතව පවත්වා ගෙන යන ස්ථාන, ආපනශාලා පවත්වා ගෙනයාම සම්බන්ධව අනුමැතිය ලත් සහතික, වෙනත්)

2. වෙනත් තොරතුරු

   i. ආපනශාලා පවත්වා ගෙනයාමට අදාල ව්‍යාපාර ලියාපදිංචි සහතිකය හා ඊට අදාල බලපත්‍ර
   ii. ආපනශාලා පවත්වා ගෙනයාම සම්බන්ධව ලැබී ඇති සහතිකපත් කුසලාන ආදිය
   iii. වෙනත් පැසසුම් ලිපි ආදිය
   iv. වීඩියෝ ,ඡායාරූප ආදිය
   v. වෙනත් පිළිගත හැකි තොරතුරු

මින් ඉහත අංක 1 මූලික තොරතුරු අතරින් අසම්පූර්ණ තොරතුරක් හෝ තොරතුරු ඉදිරිපත් කර තිබීමෙන් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. එහෙත් අයදුම්කරුගේ විස්තර හා හැකියාව පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සෑහීමකට පත් වන්නේ නම් ආරක්ෂිත බැඳුම්කරය හැර සෙසු තොරතුරු අයදුම්කරුවන්ගේ දැනට පවත්වා ගෙන යනු ලබන ආපනශාලාවන්හි සිදු කරනු ලබන ස්ථානීය පරීක්ෂාවන්හිදී සහ අදාල අධ්‍යයන තුලින් විස්තර නැවත ලබා ගැනීමට තහවුරු කර ගත හැකිය.

2.2 ප්‍රධාන ආහාර වට්ටෝරුව සඳහා උපුටා දක්වන ලද මුළු පිරිවැය අතර සැසඳීම මත ඇගයීම සිදු කරනු ලබන අතර, අවශ්‍ය නම් අනෙකුත් ප්‍රශස්ත භාණ්ඩ මිල සඳහා සැලකිය යුතු ලෙස සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ලංසුකරු හෝ ඔහු සමඟ සාකච්ඡා කර අවශ්‍ය තීන්දු ගත හැකිය.

## 03. ආපනශාලාව පත්වාගෙන යාම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවනේ ලබාදෙන පහසුකම්

3.1 ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ජලය, විදුලිය සහ ගොඩනැගිලි පහසුකම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුව මගින් ලංසුකරු වෙත නොමිලේ ලබාදෙනු ඇත.

3.2 ආහාර පිසීම සඳහා ආයතනයේ දැනට පවතින භාජන, ගෑස් උඳුන්, බොයිලේරු, පිඟන් භාණ්ඩ ඇතුළු අනෙකුත් උපකරණ (ඇමුණුම් අංක 02) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් ලබාදෙනු ඇත. අවශ්‍ය අමතර පිඟන් කෝප්ප ඇතුළු අනෙකුත් උපකරණ ලංසුකරු විසින් සපයාගත යුතුය.

3.3 ආහාර පිසීම සඳහා අවශ්‍ය ගෑස් සහ අනෙකුත් අමුද්‍රව්‍ය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා නොදෙන අතර, ආපනශාලා කළමනාකාරිත්වය විසින් අවශ්‍ය දේ සපයාගත යුතුය.

3.4 ආපනශාලාවේ විදුලි සැපයුම් ජල සැපයුම් ඇතුළු ගොඩනැගිල්ලේ ප්‍රධාන නඩත්තු කටයුතු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් සිදු කරනු ඇත.

## 04. ආපනශාලාවේ දෛනික කාර්්යයන් සහ විවෘතව තබන කාල සීමාවන්

4.1 මෙම ආපනශාලාව සතියේ සෑම දිනකම පෙ.ව.6.00 සිට ප.ව.17.00 දක්වා විවෘත කර තැබිය යුතුය. පෙ.ව. 6.00 සිට පෙ.ව. 7.30 දක්වා සේවකයින් සඳහා උදෑසන ආහාර ලබා දීමට කටයුතු කල යුතු අතර, දිවා ආහාරය සඳහා පෙ.ව.11.30 සිට ප.ව. 12.15 දක්වා ආහාර ලබා දීමට කටයුතු කල යුතුය. එමෙන් ම ව්‍යවස්ථාපිත නිවාඩු දිනවලදීත්, විශේෂයෙන් ම අලුත් අවුරුදු නිවාඩු සමයේදීත්, ආපනශාලාව විවෘතව තැබිය යුතුය. තවද ආයතනයේ කළමනාකාරිත්වය විසින් කරන ලද පෙර දැනුම්දීමකදී ආපනශාලාව විවෘතව තැබීමට එකඟ විය යුතුය.

4.2 ලංසුකරු විසින් ම ආපනශාලාව පවත්වාගෙන යායුතුය. කුමන හේතුවක් මත හෝ ලංසුකරු විසින් ආපනශාලාව හෝ ඉන් කොටසක් පවත්වාගෙන යාමට වෙනත් පුද්ගලයෙකුට (Sub Contractor) පැවරීම නොකළ යුතුය. එවැනි පැවරීමක් සනාථ වුවහොත් වහාම කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලබන අතර, ලංසුකරු විසින් තැන්පත් කරනු ලබන මුදල නැවත ගෙවනු නොලැබේ.

4.3 ලංසුකරු විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලිඛිත අවසරය කලින් ලබා නොගෙන කිසිදු දිනයක ආපනශාලාව වැසීමට කටයුතු නොකළ යුතුය. එසේ තාවකාලිකව හදිසි අවශ්‍යතාවයක් මත වසා තැබීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ලිඛිත අනුමැතිය දින හතකට (07)පෙර ලබා ගත යුතුය.

## 05. ආයතනයේ ආරක්ෂාව සහ පරිහරණය කරන දේපලවල ආරක්ෂාව සුරක්ෂිත කිරීම.

5.1 ආපනශාලාව සඳහා යොදවනු ලබන සේවකයින්ගේ ජාතික හැඳුනුම්පත් හා ඔහු හෝ ඇය පිළිබඳ පොලිස් වාර්තා ලංසුකරු විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආරක්ෂක අංශය වෙත ලබාදිය යුතුය. එම පොලිස් වාර්තා ලබාදුන් පසුව අදාල සේවකයින් සඳහා ඇතුළුවීමේ අවසරපත්‍ර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආරක්ෂක අංශය මඟින් ලබාදෙනු ඇත. සේවයෙන් ඉවත්ව යන සේවකයෙක් වෙතොත් ඔහු/ඇය පිළිබඳව තොරතුරු වහාම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර ආරක්ෂක වෙත වාර්තා කර එම සේවකයාගේ ඇතුළුවීමේ අවසර පත්‍රය ආරක්ෂක අංශය වෙත වහාම භාරදිය යුතුය.

5.2 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලිඛිත අනුමැතිය ලබා නොගෙන ආපනශාලාව පවත්වා ගෙන යන ගොඩනැගිල්ලට කිසිදු එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් ලංසුකරු විසින් නොකළ යුතුය.

5.3 ගොඩනැගිල්ලට හෝ ආයතනය සතු වෙනත් කිසියම් දේපලකට අලාභ හානි සිදු කිරීමක් කළහොත් එකී අලාභය ආයතනයේ පිරිපහදු සිවිල් අංශයේ තක්සේරුවට සහ අනුමැතියට යටත්ව ලංසුකරු විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු අතර, එසේ නැතහොත් ලංසුකරු විසින් එකී දේපල තිබූ තත්ත්වයට පත්කිරීම සඳහා දැරිය යුතු සම්පූර්ණ වියදම දරා පිරිපහදු සිවිල් අංශය සෑහීමකට පත්විය හැකි පරිදි යථා තත්ත්වයට පත්කළ යුතුය.

5.4 නියමිත දිනේ දී මෙම ගොඩනැගිල්ල නිසි පරිදි ආපසු භාරදීමට ලංසුකරු අපොහොසත් වුවහොත් ගිවිසුම් කාලසීමාව අවසන් වූ දින සිට දිනකට රු.5000.00 බැගින් කුලියක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලංසුකරු විසින් ගෙවිය යුතුය.

5.5 ලංසුකරුට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා (පිරිපහදු) භූමියට හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයට ඇතුළු වන පුද්ගලයින්, වාහන සම්බන්ධයෙන් ලංසුකරු වගකිව යුතු සේම ඒ පිළිබඳ ආරක්ෂක අංශය වෙත පූර්ව දැනුම් දීමක් කළ යුතුය.

5.6 ලංසුකරු විසින් සාමාන්‍ය විදුලි උපකරණ භාවිතා කළයුතු අතර, වැඩි ධාරිතාවයක් ඇති උපකරණ භාවිතා කිරීමට අදහස් කරන්නේ නම් එසේ භාවිතා කිරීමට පෙර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (විදුලි හා උපකරණ) ගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

5.7 ආපනශාලාවට පිටතින් රැගෙන එන අත්‍යවශ්‍ය දේපල හා බඩු භාණ්ඩ සම්බන්ධව ලිඛිත අවසරයක් ආරක්ෂක අංශයෙන් ලබා ගත යුතුය.

5.8 කිසිදු හේතුවක් මත ආයතනය හෝ සේවකයින්ගේ දේපල අවසරයකින් තොරව පිටතට රැගෙන යාම තහනම් වන අතර, එසේ සිදු වුවහොත් එම අදාල සේවකයින් ඉවත් කිරිමට ආයතන බලධාරීන්ට බලය ඇත.

## 06. ආහාර මිල ගණන් නිසි පරිදි පවත්වා ගැනීම

6.1 ඉදිරිපත් කර ඇති මිල ගණන් (අමුණුම් අංක 01) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින්ට මෙන්ම බාහිර අයට (ආතනය තුල සිටින) ද බලපැවැත්වේ.

6.2 සෑම ආහාර වර්ගයක් ම හා පානීය වර්ගයක ම මිල ගණන් ප්‍රදර්ශනය කළයුතු අතර, පාලන මිලක් නියම කර ඇති එකී වර්ග කිසි විටෙකත් වැඩි මිලකට අලෙවි නොකළ යුතුය.

6.3 ආපනශාලාවේ අලෙවි කරන සෑම අහාර පාන වර්ගයක්ම නිකුත් කිරීමේ බිල්පතක් නිකුත් කිරීමට වග බලා ගත යුතුය.

6.4 ලංසුකරු විසින් සඳහන් කරන ලද මිල ගණන් ගිවිසුම් කාලය සඳහා නොවෙනස්ව පැවතිය යුතු අතර රජය විසින් ප්‍රකාශිත මිල ගණන්හි වෙනස් වීම් මිල සංශෝධන අත්‍යාවශ්‍ය වෙතොත් ඒ සඳහා පාලන අධිකාරිය වෙත ලිඛිතව ඉල්ලීම් කර අදාල ආපනශාලා කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

## 07 . ආහාර නිසි ප්‍රමිතියෙන් පිළියෙල කිරීම, ගබඩා කිරීම සහ පිළිගැන්වීම.

7.1 ලංසුකරු විසින් ප්‍රධාන ආහාර සියල්ලක්ම ආපනශාලාව තුලම දිනපතා සකස් කිරීම ලංසුකරුගේ නමට සරිලන ලියාපදිංචි කරන ලද ආහාර සැකසීම සඳහා අනුමත සෞඛ්‍යාරක්ෂිත බාහිර පරිශ්‍රයක ලංසුකරුවන් විසින්ම සකස් කර පිසින ලද ආහාර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සෞඛ්‍යාරක්ෂිතව රැගෙන ඒමද සිදුකළ හැකිය.

එලෙස පිසින ලද ආහාර පිටතින් රැගෙන එන්නේ නම්,

i. අදාල ආහාර සැකසීමේ පරිශ්‍රය සහ ආපනශාලා පරිශ්‍රය 2012.01.26 දිනැති අංක:17/26 දරන ගැසට් පත්‍රිකාවෙහි සඳහන් වන "2011 ආහාර (සනීපාරක්ෂක) නියෝග රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

ii 1980 අංක 26 දරන ආහාර පනතට සහ 2019.01.17 දිනැති අංක:2128/4 දරන ගැසට් පත්‍රිකාවෙහි සඳහන් වන " ආහාර (පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ නියෝග)-2019" රෙගුලාසි වලට අනුව ලංසුකරු තම ආයතනය ලියාපදිංචි කර තිබිය යුතුය.

iii ලංසුකරුගේ ආහාර සැකසීමේ පරිශ්‍රය (අමුද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය ගබඩා, ආහාර සැකසුම් ස්ථාන ආදිය) පෙර දැනුම් දීමකින් තොරව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පෙර නම් කරන ලද නිලධාරින් හට පරීක්ෂා කිරීමට අවසර දීම සහ ඉහත i සහ ii හි සඳහන් ගැසට් රෙගුලාසි අනුව ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදිය පරීක්ෂා කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දීම සිදු කළ යුතුය.

7.2 ආහාර පිසීමේදී සහ පිසින ලද ආහාර ප්‍රවාහනයේදී, ගබඩා කිරීමේදී සහ ආපනශාලාව තුල ආහාර පිළිගැන්වීමේදී, අහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා අනුමත භාජන සහ උපකරණ (Food Grade) භාවිතා කළ යුතුය.

7.3 ආහාර පිළියෙල කිරීමට පෙර ඒවා නිසි පරිදි සෞඛ්‍ය ආරක්ෂිතව පිළියෙල කිරීමටත්, පිසන ලද ආහාර මැස්සන් සහ දූවිල්ලෙන් දූෂණය නොවන පරිදි සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා කළ යුතුය.

7.4 ආහාර ගබඩා කිරීමේදි මස් මාංශ ඇතුළු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වෙන වෙනම අධි ශීතකරණ තුළ සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා කළ යුතු අතර, එහි ප්‍රශස්ත උෂ්ණත්වය රැකීමට ශීතකරණය අඛණ්ඩව ක්‍රියාත්මක කලයුතු අතර, ශීතකරණය අක්‍රීය නොකල යුතුය.

7.5 ලංසුකරු විසින් සකස් කරන දිවා ආහාරය සම්බා/රතු කැකුළු බත් පිඟානකට (අඩුම වශයෙන් හාල් කිලෝ එකකින් හයෙන් එකක් (1/6) සමඟ සම්පූර්ණ බිත්තරයක් හෝ හොඳ තත්ත්වයේ මාළු හෝ කුකුළු මස් (ග්‍රෑම් 80 කට නොඅඩු බර සහිතව) ලබාදීමට එකඟ විය යුතුය. තවද දිනපතා ආහාර වේල් සඳහා එකම මාළු වර්ගය ලබා නොදිය යුතු අතර, එය දිනපතා වෙනස් වර්ගයක් විය යුතුය.

7.6 ලංසුකරු විසින් උදේ ආහාර සැපයීමේදී පාන්, බනිස්, සුදු ආප්ප, පිට්ටු, ඉදිආප්ප, කිරිබත්, කඩල. රතු කැකුළු බත්, මුං ඇට, රොටී, මාළු පාන්, රෝල්ස් ආදී ආහාර වර්ගවලින් මූලික වශයෙන් ආහාර වර්ග අටක්වත් උදේ ආහාරය සඳහා පිළියෙල කළ යුතුය.

7.7 ලංසුකරු විසින් සකස් කරනු ලබන දිවා ආහාරය සඳහා මාළු, මස්, බිත්තර සමඟ බෝංචි, කැරට්, අර්තාපල්, පරිප්පු. පොළොස්. බණ්ඩක්කා, වට්ටක්කා, අළු කෙසෙල්. ගෝවා, බීට්රූට්, මාළුමිරිස්, අල වර්ග, වම්බටු, තක්කාලි වැනි එළවළු වර්ගවල විවිධත්වයක් ඇති කළ යුතුය.

7.8 යෝගට්, අයිස්ක්‍රීම්, හා වෙනත් නිමි නිෂ්පාදනයන් ආදිය පිළිගත් ආයතනවල නිෂ්පාදන පමණක් විකිණිය යුතුය. එම භාණ්ඩවල කල් ඉකුත්වන දිනයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුය.

7.9 ලංසුකරු විසින් ආපනශාලාවේ අලෙවි කරනු ලබන සෑම ආහාර පානයක්ම ගුණාත්මක, රසවත් හා පිරිසිදු තත්ත්වයෙන් පැවතිය යුතුය.

7.10 ආහාර පිසීමේදී සහ පිළිගැන්වීමේ දී ඒ සඳහා නිසි උපකරණ භාවිතා කළ යුතුය.

7.11 ශරීරයට අහිතකර රසකාරක Monosodium Glutamate (MSG) සහ වෙනත් ද්‍රව්‍ය ආහාර පිසීමේදි භාවිතා නොකල යුතුවේ.

7.12 අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ආයතනයේ වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය නිලධාරී සහ රජයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ පරීක්ෂාවට භාජනය වන අතර ඔවුනගේ මාර්ගෝපදේශයන්ට යටත්ව ආපනශාලාව පවත්වාගෙන යා යුතු වේ.

## 08. කැලිකසල බැහැර කිරීම හා නිසි ලෙස පිරිසිදුව පවත්වා ගැනීම

8.1 එක් දිනක් තුළ ඉතිරි වන ආහාර එදිනම විනාශ කළයුතු අතර, ඒවා පසු දින ප්‍රයෝජනය සඳහා කිසිසේත් ම යොදා නොගත යුතුය. සෑම දිනකම එකතු වන අපවිත්‍ර දෑ වර්ගීකරණය කර (ඉදුල්, ප්ලාස්ටික්, කඩදාසි) ආයතනයෙන් යොදවා ඇති කුණු කසල ඉවත් කරන පාර්ශවයට භාරදිය යුතුය.

8.2 පළුදු වලින් තොර වීදුරු පිඟන් භාණ්ඩ භාවිතා කළයුතු අතර, දිනපතා ම පිරිසිදු කාරක ද්‍රව්‍යයක් යොදා ඒවා සෝදා පිරිසිදු කළ යුතුය.

8.3 සෑම විටම ගොඩනැගිල්ලේ ගෙබිම බිත්ති, ගෘහ උපකරණ සහ ආහාර ගබඩා කරන රාක්ක ආදිය දිනපතා පිරිසිදු කර පවිත්‍රව තබාගත යුතුය. විශේෂයෙන් කෑම මේස ආදිය වරින් වර පිරිසිදු කලයුතු අතර, ඉදුල් ආහාර පිඟන් හා අප ද්‍රව්‍ය මේසවල ඇත්නම් පිරිසිදු කල යුතුය.

8.4 කසල කළමනාකරණය සඳහා නිසි කසල බඳුන් මුළුතැන් ගෙය පරිශ්‍රයේත්, ආපනශාලා පරිශ්‍රයෙත් තැබීමටත්, ඒවා එදිනෙදා පිරිසිදු කිරීමටත්, වගබලා ගත යුතුය.

8.5 පිසින ලද ආහාර හා අනෙකුත් අමුද්‍රව්‍ය මීයන්, කැරපොත්තන්, හූනන් කෘමිසතුන් හා කපුටන් වැනි සතුන්ගෙන් ආරක්ෂාකර ගැනීමට පුමුඛත්වය දිය යුතුය. (ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීම අනිවාර්ය වේ)

## 09. ආහාර අලෙවිය

9.1 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සපයා ඇති පහසුකම් උපයෝගී කරගෙන ලංසුකරු විසින් සකස් කරනු ලබන ආහාරපාන පිරිපහදු ආපනශාලාවේ සහ සපුගස්කන්ද බෙදාහැරීම් පර්යන්ත ආපනශාලාවේ අලෙවි කිරීමට පමණක් සීමාවිය යුතුය. වෙනත් කිසිම හේතුවක් මත පිටස්තර ආයතන, පුද්ගලයින් වෙනුවෙන් ආහාරපාන මෙම ආපනශාලාවේ සකස් කිරීම අලෙවි කිරීම සපුරා තහනම් වේ.

9.2 ලංසුකරු විසින් අලෙවි කරන ආහාර හා බීම වර්ග අත්පිට මුදලට පමණක් අලෙවි කළ යුතුය. පෞද්ගලිකව ණය පහසුකම් මත කිසිදු පුද්ගලයෙකුට ආහාර අලෙවි නොකල යුතු අතර ඒ සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වගකියනු නොලැබේ

9.3 කිසි විටෙකත් කල් ඉකුත් වූ හා භාවිතයට නුසුදුසු ආහාර හෝ බීම වර්ග අලෙවි නොකල යුතුය.

## 10. ආපනශාලා සේවකයින්ගේ ස්වස්ථතාවය

10.1 ආපනශාලාවේ සියළුම සේවකයින් පිරිසිදු ඇඳුමකින් හෝ නිළ ඇඳුමකින් සැරසී සිටීමටත්, නිය, රැවුල, කොණ්ඩය කොටට කපා හිස් වැසුම් පැළද සේවයේ යෙදවීමටත්, ලංසුකරු වගබලා ගත යුතුය.

10.2 යම් සේවකයෙක් කිසියම් චර්ම රෝගයකින් හෝ වෙනත් කිසියම් බෝවන රෝගයකින් පෙළේ නම් ඔහු/ ඇය සේවයේ නොයෙද වීමටද, සීරීම්, කැපීම් වැනි සුළු තුවාල සහිත සේවකයින් සිටී නම් ඔවුන් ඒවා හොඳින් ආවරණය කර සේවයේ යෙදවීමට ලංසුකරු වගබලා ගත යුතුය. මේ සඳහා යොදා ගන්නා සේවකයින් සංස්ථා වෛද්‍යවරයා වෙත බාහිර පරීක්ෂණයක් සඳහා යොමු කළ යුතු වේ.

10.3 සියළුම සේවකයින් නියම කරන විටකදී වෛද්‍ය පරීක්‍ෂාවකට භාජනය විය යුතුය.

## 11. ආපනශාලා සේවකයින්ගේ සුභසාධනය සහ විනය.

11.1 ආපනශාලාවට පැමිණෙන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්යමණ්ඩලය හෝ වෙනත් බාහිර පුද්ගලයින් සමඟ ආරවුල් ඇති නොකර ගතයුතු බවට අවධාරණය කරන අතර, කිසියම් පැමිණිල්ලක් වේ නම් ආරක්ෂක කළමනාකාරට නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර- පිරිපහදුව සහ ආපනශාලා අධීක්‍ෂණ කමිටුව වෙත ලිඛිතව පැමිණිලි කළ යුතුය.

11.2 ආපනශාලාවේ සේවා නියුක්ත කරන ලද යම් පුද්ගලයෙකු නීති විරෝධී/ විනය විරෝධී ලෙස හැසිරෙන්නේ නම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් කරන ලද දැනුම් දීමකදී එම පුද්ගලයා සේවයෙන් ඉවත් කළයුතු අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පූර්ව ලිඛිත අවසරයෙන් තොරව එම පුද්ගලයා නැවත ආපනශාලාවේ සේවා නියුක්ත නොකළ යුතුය.

11.3 මෙම ආපනශාලාව සඳහා සේවකයින් බඳවා ගැනීම, ඔවුන්ට වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම, කම්කරු නීති අනුව සේවයේ යෙදවීම, ඔවුන්ගේ සේ.අ.අ. සේවක භාරකාර අරමුදල ගෙවීම හා සේවය නිසා ඇති විය හැකි ගැටළු පිළිබඳ සම්පූර්ණ වගකීම ලංසුකරු සතු වගකීම වේ.

11.4 ලංසුකරු ආපනශාලාවේ සේවය බාධාවකින් තොරව කිරීමට ප්‍රමාණවත් සේවකයන් සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීමට වගබලා ගත යුතුය. එමෙන්ම, ප්‍රමාදයකින් තොරව හා ක්‍රමවත්ව නියමිත වේලාවන් තුල ආහාර පාන පිළිගැන්වීම සිදුකළ යුතුය.

11.5 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හෝ ආයතනයට සම්බන්ධ කිසිම සේවක මහත්මයෙක් හෝ මහත්මියක් ආපනශාලාවේ කටයුතු වලට සම්බන්ධකර ගැනීම සපුරා තහනම් වේ.

11.6 ආපනශාලා සේවකයින් ආයතනයේ පවත්නා ප්‍රවේසම් නීතිරීති වලට සහ ආරක්ෂක නීතිරීති වලට අනුගත වියයුතු අතර, ආපනශාලාව තුල මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්වැටි පානය කිරීම සපුරා තහනම් වනු ඇත. එවැනි සේවකයින් ආපනශාලාවෙන් ඉවත් කිරීමට ආරක්ෂක කළමණාකරුට බලය පැවරී ඇත. එබැවින් කිසිදු මත්ද්‍රව්‍යයකට හෝ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයින් ආපනශාලා සේවකයින් ලෙස යොදා නොගත යුතුය.

## 12. ආපනශාලාවේ කටයුතු අධීක්‍ෂණය.

12.1 ලංසුකරු විසින් ආපනශාලාවේ උපකරණ හා ආපනශාලාව අවට ප්‍රදේශය පිරිසිදු තත්ත්වයෙන් පවත්වා ගෙන යායුතු අතර, පාලනාධිකාරිය විසින් බලය පවරනු ලබන නිලධාරීන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ආපනශාලාව පරීක්ෂාකර බැලීමට ඉඩ දීමට එකඟ විය යුතුය. (වෙනත් අනවසර සේවකයින් ආපනශාලාව තුලට කිසිසේත් ඇතුල් කිරිම නොකළ යුතුය)

12.2 ආපනශාලා අධීක්ෂක කමිටුව හෝ දෛනිකව ආපනශාලාව පරික්ෂා කරනු ලබන අතර, ඔවුන්ගේ මාර්ගයෙන් ලංසුකරු විසින් අදාල පැමිණිලි හෝ යෝජනා පාලනාධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

12.3 ආපනශාලා සේවකයින් ආයතන සේවකයින්ට කරදර නොවන සේ කටයුතු කලයුතු අතර සැම අයකුම එම ස්ථානයේ පවත්නා නීතිරීති වලට එකඟව කටයුතු කල යුතුය,

12.4 ලංසු පෝරමයේ සඳහන්ව ඇති කොන්දේසි කඩවීමක් සම්බන්ධව පාලනාධිකාරිය වෙත පැමිණිල්ලක් ලැබුනහොත් ඒ පිළිබඳව පරික්‍ෂණයක් පවත්වා ඒ බව ඔප්පු වුවහොත් ඕනෑම වේලාවක ඔබගේ ලංසුව අවලංගු කිරිමට ද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකියාව ඇත.

**ඇමුණුම - 01**

<u>ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදු ආපනශාලාව සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ප්‍රධාන ආහාර පැකේජය ( දිනක )</u>

| | වර්ගය | ඒකක ප්‍රමාණය | ඒකකයක මිල (රු:) | එකතුව (රු:) |
|---|---|---|---|---|
| 01. | **එළවළු කෑම**-බත් භාගයක් (සම්බා, සුදු/රතු කැකුළු) පරිප්පු සමඟ ව්‍යංජන 02ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 50 | | |
| 02. | **එළවළු කෑම-බත් පිඟානක් -** Full (සම්බා, සුදු/රතු කැකුළු) පරිප්පු සමඟ ව්‍යංජන 02ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 60 | | |
| 03. | **මාළු කෑම-බත් භාගයක්** (සම්බා, සුදු/රතු කැකුළු) මාළු පරිප්පු සමඟ ව්‍යංජන 02ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 50 | | |
| 04. | **මාළු කෑම-බත් පිඟානක් -** Full (සම්බා, සුදු/රතු කැකුළු) මාළු පරිප්පු සමඟ ව්‍යංජන 02ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 40 | | |
| 05. | **බිත්තර කෑම-බත් භාගයක්** (සම්බා, සුදු/රතු කැකුළු) බිත්තර, පරිප්පු සමඟ ව්‍යංජන 02ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 45 | | |
| 06. | **බිත්තර කෑම-බත් පිඟානක් -** Full (සම්බා, සුදු/රතු කැකුළු) බිත්තර, පරිප්පු සමඟ ව්‍යංජන 02ක්හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 40 | | |
| 07. | **කුකුල් මස් කෑම-පිඟානක්-** Full (සම්බා, සුදු/රතු කැකුළු) කුකුල් මස් , පරිප්පු සමඟ ව්‍යංජන 02ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 65 | | |
| 08. | **කුකුල් මස් කෑම-බත් භාගයක්** (සම්බා, සුදු/රතු කැකුළු) කුකුල් මස් , පරිප්පු සමඟ ව්‍යංජන 02ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම්) | 65 | | |
| 09. | **උදෑසන රතු/සුදු කැකුළු බත්** (බැදුමක් හොදි සහ සම්බෝල සමඟ) | 70 | | |
| 10 | **එළවළු බත් පිඟානක් -** Full (කීරි සම්බා) Fried Rice, කුකුල් මස්, මාලු, Chili Paste, බටු මෝජු, | 20 | | |
| 11 | **එළවළු බත් භාගයක් -** (කීරි සම්බා) Fried Rice, කුකුල් මස්, මාලු, Chili Paste, බටු මෝජු, | 20 | | |
| 12 | **උදෑසන සුදු/රතු කැකුළු බත්**, බිත්තර, හොදි සම්බෝල | 20 | | |
| 13 | **නූඩ්ල්ස් පීරිසියක්** (බිත්තර සමඟ කිරි හොද්දක්) | 35 | | |
| 14. | **ඉඳි ආප්ප** (හාල් පිටි) 15 සමඟ සම්බෝල සහ හොදි | 100 | | |
| 15 | **ඉඳි ආප්ප** (හාල් පිටි) 15 සමඟ සම්බෝල සහ බිත්තර කිරි හොදි | 20 | | |
| 16 | **පාන් ½** - බිත්තර සමඟ කිරි හොදි සහ සම්බෝල | 30 | | |
| 17 | **පාන් ½** - කිරි හොදි සහ සම්බෝල | 20 | | |
| 18. | **විශේෂ කෑම පාර්සලයක්** (කුකුල් මස් සහිත) –Fried Rice | 35 | | |
| | **මුළු ආහාර පැකේජයෙහි දවසක එකතුව** | | | |

**ඇමුණුම – 02**

**<u>ඇමුණුම් අංක: 01 ට අදාල මෙම මිල ගණන් ........................... දින දක්වා වලංගු වේ</u>**
**<u>වෙනත් උදෑසන ආහාර සහ අනෙකුත් අමතර ආහාර / බීම වර්ග</u>**

| | වර්ගය | රු: ශත |
|---|---|---|
| 1 | අමතර බත් පීරිසියක් (එළවළු සහිත) | |
| 2 | අතිරේක එලවළු පීරිසියක් | |
| 3 | කුකුල් මස් පීරිසියක් | |
| 4 | ඌරු මස් පීරිසියක් | |
| 5 | මාළු පීරිසියක් | |
| 6 | අර්තාපල් පීරිසියක් | |
| 7 | පරිප්පු පීරිසියක් | |
| 8. | ඔම්ලට් එකක්(සම්පූර්ණ බිත්තරය සමඟ) | |
| 9 | බුල්සායි එකක් (සම්පූර්ණ බිත්තරය සමඟ) | |
| 10 | බැදපු මාළු කුරියෙක් | |
| 11 | සීනි සම්බෝල පීරිසියක් | |
| 12 | කට්ට සම්බෝල පීරිසියක් | |
| 13 | සාමාන්‍ය පරිමාණයේ හාල් පිටි පිට්ටු කැබැල්ලක් | |
| 14 | සාමාන්‍ය පරිමාණයේ තිරිඟු පිටි පිට්ටු කැබැල්ලක් | |
| 15 | කිරිබත් කැබැල්ලක් සාමාන්‍ය පරිමාණයේ (කට්ට සම්බෝලයක් , සීනි සම්බල් සමඟ) | |
| 16 | තම්බපු මඤ්ඤොක්කා පීරිසියක් (කට්ට සම්බෝල පොල් සමඟ) | |
| | තම්බපු බතල පීරිසියක් (කට්ට සම්බෝල පොල් සමඟ) | |
| | තෝසේ එකක් (හොදි සම්බෝල සමඟ) | |
| | පරාටා එකක් (හොදි සම්බෝල සමඟ) | |
| 17 | කඩල පීරිසියක් (කට්ට සම්බෝල පොල් සමඟ) | |
| 18 | කවුපි පීරිසියක් (කට්ට සම්බෝල පොල් සමඟ) | |
| | මුං ඇට (කට්ට සම්බෝල පොල් සමඟ) | |
| 19 | වඩේ එකක් (පරිප්පු) | |
| 20 | ගෝදම්බ රොටි (හොදි සමඟ) | |
| 21 | පොල් රොටි (කට්ට සම්බෝල සමඟ) | |
| 22 | බිත්තර රොටි (හොදි සමඟ) | |
| 23 | බතල පීරිසියක් (කට්ට සම්බෝල පොල් සමඟ) | |
| 24 | මාළු පාන් එකක් | |

| | වර්ගය | රු: ශත |
|---|---|---|
| 25 | බිත්තර පාන් එකක් (බිත්තර 1/2 ක් සමඟ) | |
| 26 | රෝස් පාන් එකක් | |
| 27 | ටී බනිස් එකක් | |
| 28 | බටර් බනිස් එකක් | |
| 29 | එළවළු රොටී එකක් | |
| 30 | මාළු රෝල්ස් (චයිනීස් රෝල්) | |
| 31 | බිත්තර රෝල්ස් | |
| 32 | පැටිස් | |
| 33 | කට්ලට් | |
| 34 | බටර් කේක් | |
| 35 | ෆෲට් කේක් | |
| 36 | ශුදාණකතා | |
| 37 | ස්පංචි එකක් | |
| 38 | සාමාන්‍ය ප්‍රමාණයේ  ඇඹුල් කෙසෙල් ගෙඩියක් | |
| 39 | සාමාන්‍ය ප්‍රමාණයේ ආනමාළු කෙසෙල් ගෙඩියක් | |
| 40 | සාමාන්‍ය ප්‍රමාණයේ  කෝලිකුට්ටු කෙසෙල් ගෙඩියක් | |
| 41 | කහට කෝප්පයක් හකුරු සමඟ | |
| 42 | තේ කෝප්ප එකක් | |
| 43 | කිරි කහට කෝප්පයක් | |
| 44 | කිරි තේ කෝප්පයක් | |
| 45 | කෝපි එකක් | |
| 46 | කිරි කෝපි එකක් | |
| 47 | බිත්තර කෝපි එකක් | |
| 48 | සැලඩ් එකක් (ශීතකල) | |
| 49 | කිරි පැණි එකක් | |
| 52 | යෝගට් | |
| 51 | ශීත කළ බීම | |

## 13.0 <u>ආහාර වට්ටෝරු, සංයුතිය</u>

### <u>උදෑසන ආහාර වට්ටෝරු අංක : 01</u>

ii. රතු බත්/සුදු බත්
iii. පරිප්පු හෝ අල හොදි
iv. හාල්මැස්සෝ/ ගෝවා/කීරමින්/ කෙසෙල් මුව/මැකරල්/ බැදුම්
v. පොල් සම්බෝල

### <u>උදෑසන ආහාර වට්ටෝරු අංක : 02</u>

vi. පාන් 1/2
vii. අල/පරිප්පු/හාල්මැස්සෝ හොදි/ බිත්තර
viii. සම්බෝල

### <u>උදෑසන ආහාර වට්ටෝරු අංක : 03</u>

I. ඉදිආප්ප (15) (සම්බෝල සමඟ)

### <u>උදෑසන ආහාර වට්ටෝරු අංක : 04</u>

- බත්/කඩල/නුඩ්ල්ස් මිශ්‍ර කෑම
- වට්ටෝරු අංක :01 ට අදාල ව්‍යංජන ලබා දිය යුතුය.

## <u>13.01 දිවා ආහාර වට්ටෝරුව</u>

1 සම්බා, සුදු/රතු කැකුළු
2 පරිප්පු
3 ගොටුකොළ/ මුකුණුවැන්න/ ගෝවා/ කතුරුමුරුංගා /කැරට් /කංකුන් /කරවිල එක් වර්ගයකින් සම්බෝලයක් /මැල්ලුමක් ලෙස සැකසීම.

4 බීට්රූට්/වට්ටක්කා/පොලොස්/අළුකෙසෙල්/බෝංචි//දෙල්/කැරට්/ඉන්නල එක් වර්ගයකින් ව්‍යංජන ලෙස සකස් කිරිම.

5 බණ්ඩක්කා/කෙසෙල් මුව/ මැකරල්/සෝයා/වම්බටු මෝජු/ ඇඹරැල්ලා චට්නි/දඹල එක් වර්ගයකින් බැදුම් ලෙස සකස් කිරිම.

6 පපඩම් හා බදින ලද මිරිස් කරලක්

**<u>සැලකිය යුතුයි:</u>**-

(1) උදෑසන ආහාර පාර්සලය බර තැබිමේදී 250 ග්‍රෑම් විය යුතුය
(2) අංක 03,04 සහ අංක 05 හි සඳහන් අාහාර වර්ග ගැලපෙන අාහාර වට්ටොර්රුකින් සැකෙසන පරිදි තෝර ගත යුතුය.
(3) ඒ අනුව දිවා ආහාරය සම්බා බත් පරිප්පු සමඟ අනිවාර්ය වන අතර, ඉහත දක්වා ඇති පරිදි එක් මැල්ලුමක්, ව්‍යංජන දෙකක්, බැදුමක් පපඩම් හා බදින ලද මිරිස් කරලක් අන්තර්ගත විය යුතු වේ. මීට අමතරව කුකුල් මස්/මාළු/බිත්තර/ ඌරු මස් ලෙස පාර්සලය වර්ගීකරණය වේ.
(4) එක ළඟ දින 02ක් තුල එකම ව්‍යංජනය ලබා නොදිය යුතුය

**ඇමුණුම – 3**

## අයදුම්කරුගේ ප්‍රකාශය

...................................................................................................... හි පදිංචි ...................................................... වන මම මෙහි සඳහන් මූලික කොන්දේසි වලට යටත්ව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදු සහ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආපනශාලාව පවත්වා ගෙන යාමට එකඟ වන බවත්, මා විසින් සපයනු ලබන ආහාර පාන වර්ග සඳහා මීට යාකර ඇති ලැයිස්තුවෙ (ඇමුණුම් අංක 01) දැක්වෙන මිල ගණන් වලට නොවැඩි අය කිරීමට එකඟ වන බවත්, විශේෂයෙන් ම මෙම ස්ථානයේ යම් කිසි කාර්යයක යෙදීමට හෝ ඉදිරිපත් කර ඇති මිල ගණන් වැඩි කිරීමට අවශ්‍ය වුවහොත් එසේ කිරීමට ප්‍රථමයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂකගේ කැමැත්ත ලිඛිතව ලබා ගැනීමට එකඟ වන බවත්, මීට යාකර ඇති ලැයිස්තුවේ සඳහන් නොවන දෙයක් භෝජනාගාරයේ අලෙවි කිරීමට පෙර ඒ සඳහා අය කරන ගාස්තු ප්‍රමාණය සභාපති/කළමනාකාර අධ්‍යක්ෂකගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුගෙන් හෝ අනුමැතිය ලබා ගන්නා බවත්, මා විසින් භාර ගන්නා අවස්ථාවේදි භාරගත් බඩු බාහිරාදිය නොඅඩුව ආපසු ලබා දෙන බවටත්, ඉහත මෙම වගකීම් සඳහා අවශ්‍ය වන පරිදි රුපියල් ඒක්ලක්ෂ විසිපන්දහසක (125,000,00) මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නමින් මුදලින් හෝ බැංකු අණකරයක් (Performance Bond) වශයෙන් තැන්පත් කරන බවත්, (ඇමුණුම් අංක 05) එමෙන්ම මාස 3 ක අධීක්ෂණ කාලයකට යටත්ව ගිවිසුමකට අත්සන් කිරීමට එකඟ වන බවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආරක්ෂාවට හා ගෞරවයට පටහැනි වන කිසිම ක්‍රියාවක් නොකිරීමට හෝ සිදුවන්නට ඉඩ නොතැබීමට වගබලා ගන්නා බවත්, මා විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු වන සියළුම කුලී හා බදු මුදල් ආදිය සෑම මසකම 10 වැනි දිනට ප්‍රථම ගෙවා අවසන් කිරීමට එකඟ වන බවත්, ඉහත කරුණු එකක් හෝ කීපයක් මා වෙතින් කඩ වුවහොත් මා විසින් කර ඇති තැන්පතුවෙන් දඩ මුදල් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයකර ගතහැකි බව මා දන්නා බවත්, ඉහත ප්‍රකාශය කියවා බලා හොඳින් තේරුම් ගෙන අත්සන් තැබූ බවත්, මෙයින් සහතික කරමී.

..................................................................

ලංසුකරුගේ අත්සන

දිනය:- ....................................................

| | | |
|---|---|---|
| දුරකථන අංකය | : | ........................................................................ |
| ඊ මේල් | : | ........................................................................ |
| දිනය | : | ........................................................................ |
| ජාතික හැඳුනුම්පත් අංකය | : | ........................................................................ |

(ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඇමිනිය යුතුය)

**ඇමුණුම - 4**

FORM OF TENDER SECURITY

BOND NUMBER :……………………………… DATE :…………………….

SUM GUARANTEED :……………………………………

To :
Deputy Refinery Manager (Maintenance & Projects),
Ceylon Petroleum Corporation,
Refinery Division,
Sapugaskanda, Kelaniya.

Dear Sir,

By this Bond we………………………………………………………............................ (hereinafter called "the Tenderer") and we ……………………………………………………………………(name of Bank or insurance company) whose registered office is at ……………………………………………………………………………………….(hereinafter called "the Surety") are held and firmly bound into ………………………………………………………………(hereinafter called "the Authority") in the sum of ………………………………………..for the payment of which sum the Bidder and the Surety bind themselves their successors and assigns jointly and severally by these present.

Whereas the Authority has invited the Tenderer and other persons to complete tenders in similar terms for the supply of ………………………………………………………………………..and works associated (hereinafter called "the Tender") in accordance with such invitation, the Bond shall provide security to the Authority that the Tenderer will honour certain obligations to be undertaken by him in the Tender in accordance with the following conditions.

Now the Conditions of this Bond are :

(a) that it shall remain in full force and effect until the earliest of

(i) **(Date), being Ninety (90) days** from (submission date), the date stipulated by the Authority for the submission of tender, or any prolongation of such date above notified to the Authority by the Tenderer and the Surety in writing:

(ii) In the event of the Tender by the Authority, the date upon which the Tender provides a performance security to the Authority in accordance with the terms of the contract thereby made between them, or

(iii) In the event of acceptance of the Authority of a tender for the work from a third party the date upon which such third party provides the relevant performance security.

(b) Subject to this Bond being in full force and effect, the Surety shall pay the full amount specified in this Bond upon receipt of first written demand from the Authority stating that

(i) The Tenderer has withdrawn his Tender during the Tender period, or

(ii) The Tenderer has failed to provide a performance security to the Authority in accordance with the terms of the contract between them upon acceptance of the Tender.

No alteration in the terms of the Tenderer, nor any forbearance or forgiveness in or in respect of any matter or thing concerning the Tender on the part of the Authority, nor any objection from the tenderer shall in any way release the Surety from any liability under this Bond.

The benefit of this Bond shall not be assignable by the Authority and upon its ceasing to be in full force and effect the Authority shall return the same to the Tenderer.

This Bond shall be governed by the laws of Sri Lanka.

I executed as a Date this ( ) day of ( ) 2026 ( ) For and on behalf of the Tenderer………………for and on behalf of the Surety………… ………………………………………………………………………………………………

Signed by…………………………………… Signed by…………………………………….

In the capacity of ………………………… In the capacity of ……………………………

And by……………………………………….And by………………………………………..

In the capacity of…………………………….In the capacity of …………………………….

Seal (where applicable) Seal (where applicable)

ඇමුණුම -5

FORM OF PERFORMANCE SECURITY

BOND NUMBER :……………………………… DATE :…………………….
SUM GUARANTEED :………………………………….

To :
Deputy Refinery Manager (Maintenance & Projects),
Ceylon Petroleum Corporation,
Refinery Division,
Sapugaskanda, Kelaniya.

Dear Sir,

Whereas…………………………………………………………………………………………… ………. (name and address of contractor) Therein-after called "the contractor" has undertaken, in pursuance of contract no……………………………………………………………..dated…………… to executes…………………………………………………………….......(name of contract) therein after called "the contract"

And whereas it has been stipulated by you in the said Contract that the Contractor shall furnish you with a Bank Guarantee by a recognized Bank for the sum specified therein as security for compliance with his obligations in accordance with the Contract.

And whereas we have agreed to give Contractor such a Bank Guarantee.

Now therefore we hereby affirm that we are the Guarantor and responsible to you, on behalf of the Contractor, up to a total of ……………………………………………………………...........................................................................(amount of Guarantee)……………………………………………………………(amount in words), such sum being payable in the type and proportions of currencies in which the Contract price is payable, and we undertake to pay you, upon your first written demand and without cavil or argument, any sum or sums within the limits of ……………………………………………………………….(Amount of Guarantee) as aforesaid without your needing to prove or to show ground or reasons for your demand for the sum specified therein.

We hereby waive the necessity of your demanding the said debt from the contractor before presenting us with the demand.

We further agree that no change or addition to or other medication of terms of the contract or of the works to be performed there under or of any of the contract document which may be made between you and the Contractor shall in any way release us from any liability under this Guarantee, and we hereby waive notice or any such change, addition or modification.

This Guarantee shall be valid until 365 days from the date of confirmation of the tender to run the Canteen at Refinery and Sapugaskanda Distribution Terminal - …./.../2026

Signature and Seal of the Guarantor : ...................................................................................

Name of the Bank : ...................................................................................

Address of the Bank : ...................................................................................

Date : ...................................................................................

Witness

ඇමුණුම – 6

**<u>ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ ආපනශාලාව පවත්වාගෙනයාම සඳහා වූ ගිවිසුම</u>**

මෙම ගිවිසුම ශ්‍රී ලංකා ජනරජයේ කොළඹ නගරයේදී 2018 ජූලි මස 12 වන දින, 1961 අංක 28 දරන පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපිත කර ඇති, කොළඹ 09, දොස්තර ඩැනිස්ටර්ද සිල්වා මාවත, අංක: 609 හි ප්‍රධාන කාර්යාලය පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කාර්යාංශය (CPC - Refinery) (මෙතැන් සිට "පළමු පාර්ශ්වය" ලෙස හඳුන්වනු ලබන අතර අවශ්‍ය පරිදි එහි අනුප්‍රාප්තිකයන් සහ පැවැරුම්ලාභීන් ඇතුලත් වන පරිදි අර්ථ දක්වනු ලැබේ.) එක් පාර්ශ්වයක් වශයෙන්
සහ

ශ්‍රී ලංකා ජනරජයේ ........................................................................................................................................ ප්‍රධාන කාර්යාලය පිහිටි ආපනශාලා පවත්වා ගෙන යාම සහ ආපනශාලා සේවා සැපයීමේ කාණ්ඩය යටතේ ශ්‍රී ලංකා ජනරජයේ ව්‍යාපාර නාම ලේඛනයේ ............................................... අංකය යටතේ ලියාපදිංචි වී ඇති (මෙතැන් සිට " දෙවන පාර්ශ්වය" ලෙස හඳුන්වනු ලබන අතර අවශ්‍ය පරිදි එහි අනුප්‍රාප්තිකයන් සහ පැවැරුම්ලාභීන් ඇතුලත් වන පරිදි අර්ථ දක්වනු ලැබේ) අනෙක් පාර්ශ්වයක් වශයෙන් මෙම ගිවිසුමට එළඹ ඇත.

එසේම පළමු පාර්ශ්වය විසින් අංක A හි සඳහන් කර ඇති පරිදි ආපනශාලා සේවාව පවත්වා ගෙන යාම අවශ්‍ය වන අතර, එසේම දෙවන පාර්ශ්වය විසින් B.O.Q විස්තර හා පිරිවිතර වන සඳහන් වන පරිදි ආපනශාලා සේවා සැපයීම හා පවත්වා ගෙන යාම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර,

එසේම, එම සේවාව ඉටු කිරිම සඳහා අවශ්‍ය පළපුරුද්ද, බලපත්‍ර, ලියාපදිංචිය, සුදුසුකම් හා කාර්ය මණ්ඩලය තමන් සතුව ඇති බව දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරයි.

<u>අංක A</u>

එකී ගිවිසුමේ කොන්දේසි හා පිළිගැනීම් කවරේද යත්,

1. මෙම ගිවිසුමේ පළමු පාර්ශ්වය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් පිරිපහදුවේ හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ පිහිටි ආපනශාලා ................................ දින සිට ................................ දින දක්වා මාස .................( ...... ) කාලයකට පවත්වාගෙන යාමට දෙවන පාර්ශ්වය අවසර දෙනු ලැෙබ්.

2. ගැණුම්කාර දෙවන පාර්ශ්වය විසින් සපයනු ලබන ආහාරපාන වර්ග මෙම ගිවිසුමේ පළමු වන උපලේඛණයේ ලැයිස්තුවේ දැක්වෙන මිළ ගණන් වලට නොවැඩි විය යුතුය.

3. මෙම ගිවිසුමේ පළමුවන උපලේඛනයේ ලැයිස්තුවේ සඳහන් නොවන යම් දෙයක් භෝජනාගාරයේ අලෙවි කිරීමට පෙර එකී ආහාර ද්‍රව්‍ය හා එය විකිණීමට තබන මිල පිළිබඳව දීමණාකාර සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂකගේ හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිළධාරියෙකුගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

4. මෙම ගිවිසුමේ පළමුවන උපලේඛනයේ ලැයිස්තුවේ නියමකර ඇති ආහාරපාන එහි නියමකර ඇති මිළට වඩා වැඩි මිලකට විකිණීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා පිරිපහදු කාර්යාංශයේ පිරිපහදු කළමනාකාර හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිළධාරියෙකුගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

5. මෙම ආපනශාලාව දෙවන පාර්ශ්වය විසින් බාරගනු ලබන අවස්ථාවේදි එකී පාර්ශ්වය විසින් බාර ගන්නා බඩු බාහිරාදිය නොඅඩුව ආපසු බාරදිය යුතුය.

6. ආපනශාලාව පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ජලය, විදුලිය සහ ගොඩනැගිලි පහසුකම් පිරිපහදු කාර්යාංශය හා සපුගස්කන්ද බෙදාහැරීම් පාර්යන්තය මඟින් දෙවන පාර්ශ්වය වෙත නොමිලේ ලබාදෙනු ඇත.

7. දෙවන පාර්ශ්වය ආහාර පිසීම සඳහා ආයතනයේ දැනට පවතින භාජන, ගෑස් උඳුන්, බොයිලේරු, පිඟන් භාණ්ඩ ඇතුළු අනෙකුත් උපකරණ පළමු පාර්ශ්වය සතු පිරිපහදු කාර්යාංශය මගින් ලබා දෙනු ඇත. එකී උපකරණ අදාල ලංසු පත්‍රිකාවේ දෙවන ඇමුණුමේ සඳහන් වේ. අවශ්‍ය අමතර පිඟන් කෝප්ප ඇතුළු අනෙකුත් උපකරණ දෙවන පාර්ශ්වය විසින් සපයා ගත යුතුය.

8. ආහාර පිසීම සඳහා අවශ්‍ය ගෑස් සහ අනෙකුත් අමුද්‍රව්‍ය පළමු පාර්ශ්වය විසින් ලබා නොදෙන අතර, දෙවන පාර්ශ්වය විසින් අවශ්‍ය දේ සපයා ගත යුතුය.

9. පිරිපහදුව හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආපනශාලා විදුලි සැපයුම් ජල සැපයුම් ඇතුළු ගොඩනැගිල්ලේ ප්‍රධාන නඩත්තු කටයුතු පළමු පාර්ශ්වය සතු පිරිපහදු කාර්යාංශය මඟින් කරනු ඇත.

10. ගිවිසුම්ගත ආපනශාලා ඉරිදා සහ පෝය දින ඇතුළුව සතියේ සෑම දිනකම පෙ.ව 6.00 සිට පෙ.ව 7.30 දක්වාත්, පෙ.ව 11.30 සිට ප.ව 12.15 දක්වාත් ප.ව. 16.30 සිට 17.00 දක්වාත් අනිවාර්යෙන්ම විවෘත කර තැබිය යුතුය. එමෙන්ම ආයතනයේ ව්‍යවස්ථාපිත නිවාඩු දිනවලදීත්, විශේෂයෙන් ම අලුත් අවුරුදු නිවාඩු සමයේදීත්, ආපනශාලාව විවෘතව තැබිය යුතුය. තවද පිරිපහදු කළමනාකාරීත්වය විසින් කරන ලද පෙර දැනුම් දීමක දී අවශ්‍ය විටෙක ආපනශාලාව විවෘතව තැබිමට දෙවන පාර්ශවය එකඟ විය යුතුය.

11. පිරිපහදු කාර්යාංශය හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ සේවක මහත්ම මහත්මීන්ට මෙන්ම පිටතින් පැමිණෙන ආගන්තුකයන් සඳහා ද අවශ්‍ය ආහාර, කෙටි ආහාර හා බීම වර්ග ලබා ගැනීම සඳහා අමතර කවුන්ටරයක් විවෘතව තැබීමට දෙවන පාර්ශ්වය කටයුතු කළ යුතුය. එය පෙ.ව. 6.00 සිට ප.ව. 7.30 දක්වා පෙ.ව 11.30 සිට ප.ව 12.15 දක්වාත් ප.ව. 16.30 සිට 17.00 දක්වා විය යුතුය.

12. මෙම ගිවිසුමට අදාල දෙවන පාර්ශවය විසින්ම ආපනශාලාව පවත්වාගෙන යා යුතුය. කුමන හේතුවක් මතවත් ගැණුම්කරු විසින් ආපනශාලාව පවත්වාගෙන යාමට වෙනත් පුද්ගලයෙකුට පැවරීම නොකළ යුතුය. එවැනි පැවරීමක් සනාථ වුවහොත් වහාම මෙකී ගිවිසුම හා කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලබන අතර, ලංසුකරු විසින් තැන්පත් කරනු ලබන මුදල නැවත ගෙවනු නොලැබේ.

13. දෙවන පාර්ශවය විසින් පිරිපහදු කළමනාකාරගෙන් කලින් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව කිසිදු දිනයක ආපනශාලාව වැසීමට කටයුතු නොකළ යුතුය.

14. ආපනශාලා සඳහා යොදවනු ලබන සේවකයින්ගේ ජාතික හැඳුනුම්පත් හා ඔහු හෝ ඇය පිළිබඳ පොලිස් වාර්තා දෙවන පාර්ශවය විසින් පිරිපහදුව හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආරක්ෂක අංශය වෙත ලබාදිය යුතුය. එකී පොලිස් වාර්තා ලබා දුන් පසුව අදාළ සේවකයින් සඳහා ඇතුළුවීමේ අවසර පත්‍ර  පිරිපහදුව හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ  ආරක්ෂක අංශය මඟින් ලබාදෙනු ඇත. සේවයෙන් ඉවත්ව යන සේවකයෙක් වෙතොත් ඔහු- ඇය පිළිබඳව තොරතුරු වහාම පිරිපහදු පිරිපහදුව හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආරක්ෂක අංශය වෙත වාර්තා කර එම සේවකයාගේ ඇතුළුවීමේ අවසර පත්‍රය ආරක්ෂක අංශය වෙත වහාම භාරදිය යුතුය.

15. පළමු පාර්ශ්වය සතු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ ලිඛිත අනුමැතිය ලබා නොගෙන ආපනශාලාව පවත්වා ගෙන යන ගොඩනැගිලි වලට කිසිඳු එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් දෙවන පාර්ශවය විසින් නොකළ යුතුය.

16. ගොඩනැගිලි වලට හෝ  පළමු පාර්ශ්වය  සතු වෙනත් කිසියම් දේපලකට අලාභ හානි සිදු කිරීමක් කළහොත් එකී අලාභය දෙවන පාර්ශවය  විසින් පළමු පාර්ශවයට ගෙවිය යුතු අතර, එ සේ නැතහොත් ගැණුම්කරු විසින් එකී දේපල තිබූ තත්ත්වයට පත් කිරීම සඳහා දැරිය යුතු සම්පූර්ණ වියදම දරා යථා තත්ත්වයට පත්කළ යුතුය.

17. නියමිත දිනදී මෙම ගොඩනැගිලි නිසි පරිදි ආපසු භාරදීමට ගැණුම්කරු අපොහොසත් වුවහොත් ගිවිසුම් කාලසීමාව අවසන් වූ දින සිට දිනකට රු.5000.00 බැගින් කුළියක් පළමු පාර්ශවයට, දෙවන පාර්ශවය විසින් ගෙවිය යුතුය.

18. දෙවන පාර්ශවයට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සඳහා පළමු පාර්ශවයට හිමි පිරිපහදු භූමියට හා පිරිපහදු හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයට ඇතුළු වන පුද්ගලයින් සම්බන්ධයෙන් ගැණුම්කරු වගකිව යුතුය.

19. ගැණුම්කරු විසින් සාමාන්‍ය විදුලි උපකරණ භාවිතා කළයුතු අතර, වැඩි ධාරිතාවයක් ඇති උපකරණ භාවිතා කිරීමට අදහස් කරන්නේ නම් එසේ භාවිතා කිරීමට පෙර දෙවන පාර්ශවය පිරිපහදු  පාලනාධිකාරියේ ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

20. ඉදිරිපත් කර ඇති මිල ගණන් (පළමු උපලේඛණයට අනුව) පළමු පාර්ශ්වය සමාගමේ සේවකයින්ට මෙන්ම බාහිර( ආයතනය තුල සිටින) අයට ද බල පැවැත්වෙ.

21. සෑම ආහාර පානයකම මිල ප්‍රදර්ශනය කළයුතු අතර, පාලන මිලක් නියම කර ඇති ආහාර පාන කිසි විටෙකත් වැඩි මිලකට අලෙවි නොකළ යුතුය.

22. දෙවන පාර්ශවය විසින් සඳහන් කරන ලද මිල ගණන් අදාල ගිවිසුම් කාලය සඳහා නොවෙනස්ව පැවතිය යුතුයි.

23. ආහාර පිළියෙල කිරීමට පෙර ඒවා නිසි පරිදි සෝදා පිළියෙල කිරීමටත් පිසන ලද ආහාර මැස්සන් සහ දූවිල්ලෙන් දූෂණය නොවන පරිදි ගබඩා කළ යුතුය.

24. ආහාර ගබඩා කිරීමේදී මස් මාංශ වෙනම අධි ශීතකරණ තුළ ගබඩා කළ යුතුය.

25. දෙවන පාර්ශවය විසින් සකස් කරන දිවා ආහාරය සම්බා, රතු කැකුළු බත් පිඟානකට (අඩුම වශයෙන් හාල් කිලෝ එකකින් හයෙන් එකක් (1-6) සමව සම්පූර්ණ බිත්තරයක් හෝ හොඳ මාළු හෝ කුකුළු මස් (ග්‍රෑම් 85 කට නොඅඩු බර සහිතව) ලබා දීමට කටයුතු කළ යුතුය.

26. දෙවන පාර්ශවය විසින් උදේ කෑම සැපයීමේදී පාන්, බනිස්, ආප්ප, පිට්ටු, ඉදිආප්ප, කිරිබත්, කඩල. රතු කැකුළු බත්, මුං ඇට, රොටී, මාළු පාන්, රෝල්ස් ආදී කෑම වර්ග අටක්වත් උදේ කෑම සඳහා පිළියෙල කළ යුතුයි. දිනපතා කෑම වර්ගවල විවිධත්වයක් ඇති කළ යතුය.

27. දෙවන පාර්ශවය විසින් සකස් කරනු ලබන දිවා ආහාරය සඳහා මාළු, මස්, බිත්තර, සමඟ බෝංචි, කැරට්. අර්තාපල්. අල, පරිප්පු. පොලොස්. බණ්ඩක්කා, වට්ටක්කා, අළු කෙසෙල්. ගෝවා, බීට්රූට්, මාළු මිරිස්, වම්බටු, තක්කාලි වැනි එළවළු වර්ගවල විවිධත්වයක් ඇති කළ යුතුය.

28. යෝගට්, අයිස්ක්‍රීම්, හා වෙනත් නිම් නිෂ්පාදනයන් ආදිය පිළිගත් ආයතනවල නිෂ්පාදන පමණක් විකිණිය යුතුය. නිෂ්පාදිත ආයතනයේ ලේබල් නොමැතිව අලෙවි නොකල යුතුය.

29. දෙවන පාර්ශවය විසින් ආපනශාලාවෙ අලෙවි කරනු ලබන සෑම ආහාර පානයක්ම රසවත් හා පිරිසිදු තත්ත්වයෙන් පැවතිය යුතුය.

30. පිසින ලද ආහාර පිළිගැන්වීමේදී ඒ සඳහා නිසි උපකරණ භාවිතා කළ යුතුය.

31. කැලි කසල බැහැර කිරීම හා නිසි ලෙස පිරිසිදුව තබා ගැනීම.

32. එක් දිනක් තුළ ඉතිරිවන ආහාර එදිනම විනාශ කළයුතු අතර, ඒවා පසු දින ප්‍රයෝජනය සඳහා කිසිසේත්ම යොදා නොගත යුතුය. සෑම දිනකම එකතු වන අපවිත්‍ර දෑ එක්කර ආයතනයෙන් යොදවා ඇති කුණු කසල ඉවත් කරන ජංගම රථයට භාරදිය යුතුය.

33. පළුදු වලින් තොර වීදුරු පිඟන් භාණ්ඩ භාවිතා කළයුතු අතර, දිනපතාම පිරිසිදු කාරක ද්‍රව්‍යයක් යොදා ඒවා සෝදා පිරිසිඳු කළ යුතුය.

34. සෑම විටම ගොඩනැගිල්ලේ ගෙබිම බිත්ති, ගෘහ උපකරණ සහ ආහාර ගබඩා කරන රාක්ක ආදිය දිනපතා පිරිසිදු කර පවිත්‍රව තබාගත යුතුය.

35. කසල කළමනාකරණය සඳහා නිසි කසල බදුන් මුළුතැන්ගෙයි තුළ හා ආපනශාලා පරිශ්‍රයෙන් තැබීමටත්, ඒවා එදිනෙදා පිරිසිදු කිරීමටත්, වගබලා ගත යුතුය.

36. පළමු පාර්ශ්වය විසින් සපයා ඇති පහසුකම් උපයෝගී කර ගෙන ගැණුම්කරු විසින් සකස් කරනු ලබන ආහාරපාන ආපනශාලාවේ අලෙවි කිරීමට පමණක් සීමා විය යුතුය. වෙනත් කිසිම හේතුවක් මත පිටස්තර ආයතන වෙනුවෙන් ආහාර පාන මෙම ආපනශාලාවේ සකස් කිරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

37. දෙවන පාර්ශවය විසින් අලෙවි කරන ආහාර හා බීම වර්ග අත්පිට මුදලට අලෙවි කළ යුතු අතර, පෞද්ගලිකව කිසිදු පුද්ගලයෙකුට සපයනු ලබන ණය පහසුකම් සඳහා පළමු පාර්ශවය විසින් වගකියනු නොලැබි.

38. කිසිවිටෙකත් කල් ඉකුත් වූ හා භාවිතයට නුසුදුසු ආහාර හෝ බීම වර්ග අලෙවි නොකල යුතුය.

39. ආපනශාලාවේ සියළුම සේවකයින් පිරිසිදු ඇඳුමකින් හෝ නිළ ඇඳුමකින් සැරසී සිටීමටත්, නිය, රැවුල, කොණ්ඩය කොටට කපා සේවයේ යෙදවීමටත් දෙවන පාර්ශවය විසින් වගබලා ගත යුතුය.

40. යම් සේවකයෙක් කිසියම් චර්ම රෝගයකින් හෝ වෙනත් කිසියම් බෝවන රෝගයකින් පෙලේ නම් ඔහු, ඇය සේවයේ නොයෙදවීමට ද, සීරීම්, කැපීම් වැනි සුළු තුවාල සහිත සේවකයින් සිටී නම් ඒවා හොඳින් ආවරණය කර සේවයේ යෙදවීමට ගැණුම්කරු වගබලා ගත යුතුය.

41. ආපනශාලාවට පැමිණෙන සංස්ථා සේවක, සේවිකාවන් හෝ වෙනත් බාහිර පුද්ගලයින් සමඟ ආරවුල් ඇතිකර නොගත යුතු අතර, කිසියම් පැමිණිල්ලක් වේ නම් ආරක්ෂක කළමණාකාරවරයාට සහ ආපනශාලා අධීක්ෂණ කමිටුව වෙත පැමිණිලි කළ යුතුය.

42. ආපනශාලාවේ සේවා නියුක්ත කරන ලද යම් පුද්ගලයෙකු අනිසි ලෙස හැසිරෙන්නේ නම් පලමු පාර්ශවයෙන් කරන ලද දැනුම් දීමකදී එම පුද්ගලයා සේවයෙන් ඉවත් කළ යුතු අතර, පිරිපහදු කාර්යාංශයේ හෝ සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ පූර්ව ලිඛිත අවසරයෙන් තොරව එම පුද්ගලයා නැවත ආපනශාලාවේ සේවා නියුක්ත නොකළ යුතුය.

43. මෙම ආපනශාලාව සඳහා සේවකයින් බඳවා ගැනීම, ඔවුන්ට වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම, කම්කරු නීති අනුව සේවයේ යෙදවීම, අදාල ගෙවීම් සිදු කිරීම, හා ඔවුන්ගේ සේවය නිසා ඇති විය හැකි ගැටළු පිළිබඳ සම්පූර්ණ වගකීම දෙවන පාර්ශවය සතු වගකීම fවි.

44. දෙවන පාර්ශවය ආපනශාලාවේ සේවය කිරීමට ප්‍රමාණවත් සේවකයන් සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීමට වගබලා ගත යුතුය.

45. පළමු පාර්ශ්වය සමාගමට සම්බන්ධ ව කිසිම සේවක මහත්මයෙක් හෝ මහත්මියක් ආපනශාලාවේ කටයුතු වලට සම්බන්ධ කර ගැනීම තහනම් වේ.

46. දෙවන පාර්ශවය විසින් ආපනශාලාවේ උපකරණ හා ආපනශාලාව අවට ප්‍රදේශය පිරිසිදු තත්ත්වයෙන් පවත්වා ගෙන යායුතු අතර, පාලනාධිකාරිය විසින් බලය පවරනු ලබන නිලධාරීන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ආපනශාලාව පරීක්ෂා කර බැලීමට ඉඩ දීමට එකඟ විය යුතුය.

47. පළමු පාර්ශ්වයේ සමාගමේ සුභසාධක අංශයේ නිලධාරීන් විසින් දෛනිකව ආපනශාලාව පරීක්ෂා කරනු ලබන අතර, ඔවුන්ගේ මාර්ගයෙන් ගැණුම්කරු විසින් අදාළ පැමිණිලි හෝ යෝජනා පාලනාධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

48. මෙම ගිවිසුමට අදාල ටෙන්ඩර් පෝරමයේ සඳහන් වී ඇති කොන්දේසි කඩවීමක් සම්බන්ධව දීමණාකාර පාර්ශවය වෙත පැමිණිල්ලක් ලැබුනහොත්, ඒ පිළිබඳව පරික්ෂණයක් පවත්වා ඒ බව ඔප්පු වුවහොත් ඕනෑම වේලාවක ඔබගේ ටෙන්ඩරය අවලංගු කිරීමටද පළමු පාර්ශවයට හැකියාව ඇත.

49. ගැණුම්කරු ආපනශාලාව භාරගත් දින සිට මාස 12 ක කාලයකට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කාර්යාංශයේ හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආපනශාලාවල සේවය සැපයීමට බැඳී සිටී.

50. ගැණුම්කරු විසින් පිරිපහදුව හා සපුගස්කන්ද බෙදා හැරීම් පර්යන්තයේ ආපනශාලා සඳහා ලබාදෙන දේපල වෙනුවෙන් කාර්ය සාධක බැදුම්කරයක් (Performance Bond ) ලෙස ගිවිසුම් කාලය අවුරුද්දක් දක්වා වලංගු වන පරිදි නැවත ගෙවන රුපියල් ඒක්ලක්‍ෂ විසිපන්දහසක (රු. 125,000.00 ක) තැන්පතු මුදලක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ ආයතනය නමින් මුදලින් තැන්පත් කිරීමෙන් හෝ එම වටිනාකමින් යුතු බැංකු අණකරයක් (හතර වන උපලේඛනය) ගැණුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. එකී ඇප තැන්පතුව වෙනුවෙන් කිසිඳු පොළියක් දීමණාකාර සමාගම විසින් දෙවන පාර්ශවය වෙත ගෙවනු නොලැබේ. පිරිපහදුව විසින් විසින් සපයනු ලබන උපකරණ (ඇමුණුම් 02) සඳහා අලාභ හානි සිදුවුව හොත් මෙම ගිවිසුම් කාල සීමාව අවසානයේදී ඒවා තැන්පත් මුදලින් ආවරණය කරගනු ලබන අතර, තැන්පත් මුදලින් ඉතිරි මුදලක් වේ නම් එම මුදල මෙම ගිවිසුම අවසානයේදී ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය භාරදුන් වහාම පිරිපහදුව විසින් ගැණුම්කරු වෙත ආපසු ගෙවනු ලැබේ.

51. දෙවන පාර්ශවය පළමු පාර්ශවය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. ගිවිසුම් කාල සීමාව අවසන් වූ දින ගැණුම්කරු විසින් ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය පළමු පාර්ශවයට ආපසු භාරදිය යුතුය.

52. නියමිත කාළ සීමාව අවසන් වීමට පෙර ගිවිසුම අවසන් කිරීමට ගැණුම්කරු හෝ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අදහස් කරන්නේ නම් එකී පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත ඒ පිළිබඳව මාසයකට පෙර දැනුම් දිය යුතුය.

53. පිරිපහදු ආපනශාලාව පවත්වාගෙන යන වසරක කාල සීමාව අවසන් වූ පසු ඒම මිල ගණන් වලටම තවත් මාස 03 කට එම සේවාව සැපයීමට ටෙන්ඩර්කරු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමග එකග වේ.

54. මෙම ගිවිසුම සම්බන්ධයෙන් ඇති වන සියළුම ප්‍රශ්න හා ගැටළු පළමු පාර්ශවයේ පිරිපහදු ආපනශාලා කමිටුව වෙත ඉදිරිපත් කළයුතු අතර, එකී ප්‍රශ්න හෝ ගැටළු සම්බන්ධයෙන් සම්පාදන කමිටුවේ සභාපති විසින් ගනුලබන තීරණ අවසාන තීරණ වේ.

ඉහත ගිවිසුම කියවා බලා තේරුම් ගෙන ඉහත සඳහන් පිළිගැනීම හා කොන්දේසි වලට එකඟ වෙමින් දෙපාර්ශවය විසින් 2026.......... වන දින සපුගස්කන්දේ දී අත්සන් තබන ලදි.

| <u>පළමු පාර්ශවය</u> | <u>දෙවන පාර්ශවය</u> |
|---|---|
| කේ.ජී.එච්.කෝද්දාගොඩ<br>පිරිපහදු කළමනාකාර<br>ලංකා ඛනිජ තෙල් නීතීගත සංස්ථාව<br>පිරිපහදු කාර්යාංශය | කළමනාකාර<br>..................................................................<br>..................................................................<br>.................................................................. |

<u>සාක්ෂිකරුවන්</u>

1. නම : ................................................
   ලිපිනය: ................................................
   අත්සන: ................................................

2. නම : ................................................
   ලිපිනය: ................................................
   අත්සන: ................................................

<u>සාක්ෂිකරුවන්</u>

1. නම : ................................................
   ලිපිනය : ................................................
   අත්සන : ................................................

2. නම : ................................................
   ලිපිනය : ................................................
   අත්සන : ................................................